(අටවැනි පාර්ලිමේන්තුව - තෙවැනි සභාවාරය)

**අංක 1(1).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2018 නොවැම්බර් 21 වැනි බදාදා**

## දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 2/'18

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු අර්ජුන රණතුංග මහතා

ගරු මනෝ ගනේසන් මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා,— ජනරජයේ අරමුදල්වලින් අමාත්‍යවරුන්, රාජ්‍ය අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන් සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බව,— 2018 නොවැම්බර් 14 වැනි දින සම්මත කර ගන්නා ලද ආණ්ඩුවට එරෙහි විශ්වාසභංග යෝජනාවේ 2 වැනි ඡේදයට අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය විසිරී ඇති බවට කථානායකවරයා විසින් 2018 නොවැම්බර් 15 වැනි දින කරන ලද නිල ප්‍රකාශය මෙම සභාව 2018 නොවැම්බර් 16 වැනි දින පිළිගත් හෙයින් ද, ඒ අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 48 වැනි ව්‍යවස්ථාවේ අරමුණු කොට ඇති පරිදි 2018 ඔක්තෝබර් 26 වැනි දින සිට ගරු මහින්ද රාජපක්ෂ මහතා ඇතුළු ආණ්ඩුව කෙරෙහි මෙම සභාවේ විශ්වාසයක් නොමැති බවට මෙම සභාව තවදුරටත් යෝජනා සම්මත කරගත් හෙයින් ද;

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වැනි ව්‍යවස්ථාවෙන් බලය පැවරී ඇති පරිදි රාජ්‍ය මූල්‍යය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු හෙයින් ද;

2018 නොවැම්බර් 15 වැනි දින සිට අමාත්‍යවරුන්ගේ, රාජ්‍ය අමාත්‍යවරුන්ගේ, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා වැටුප් හා අනෙකුත් පාරිශ්‍රමිකයන් ගෙවීම පිණිස ජනරජයේ අරමුදල් වෙතින් කිසිදු වියදමක් අනුමත කිරීමට කවර හා සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට කිසිදු බලයක් නොමැති බවටත්, ඉහත කී අමාත්‍යවරුන් වෙනුවෙන් විදේශ සංචාර, හෙලිකොප්ටර් යානා භාවිතය ඇතුළු අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා ඇති වූ වියදම් පියවීම ද තහනම් වන අතර මෙම යෝජනා සම්මතය උල්ලංඝනය කරමින් කවර හෝ ක්‍රියාමාර්ගයක් ගන්නා කවර හෝ තැනැත්තෙකුට එරෙහිව නීතිමය පියවර ගත යුතු බවටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.